# හොඳ මී මැස්සෝ



කතාව සහ චිත්‍ර

නිෂිනි රිදීමහලියද්ද

# හොඳ මී මැස්සෝ

නිෂිනි රිදීමහලියද්ද

ISBN 978 624 208 9614

හොඳ මී මැස්සෝ

© නිෂිනි රිදීමහලියද්ද

ISBN 978 624 208 9614

# පිදුම

*මා හට අකුරු කියාදී*

*යහමග පෙන්වූ*

*ගුරු මෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ට*

*ආදරයෙන්*

*පුදමි.*



# පෙරවදන


දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

එක්තරා කැලයක ලොකු අඹ ගසක මී වදයක් තිබුණා. ඒ මී වදයේ මී මැස්සෝ රංචුවක් හිටියා. මී මැස්සෝ ගොඩක් මහන්සි වෙලා මී පැණි එකතු කලා.



ගස්වල පැන පැන යන වඳුරෙක් දවසක් මේ මී වදය දැක්කා. වඳුරාට මී පැණි බොන්න ආස හිතුණා. ඒත් වඳුරා මී වදය ළඟට යන්න බය වුණා.



ඉතින් මේ වඳුරා හැමදාම ඇවිත් බලනවා මී වදේ මී මැස්සෝ ඉන්නවාද කියලා.දවසක් දා මී මැස්සෝ නැති වෙලාවක මී වදය ළඟට ගියා.




වඳුරා හිමීට මී වදය කඩා ගන්න යද්දිම මී මැස්සෝ රංචුවක් එතනට ආවා.



හොඳටම බය වුණු වඳුරා ගස් වලින් පැන පැන ගියා. මී මැස්සෝ රංචුව වඳුරාගේ පස්සෙන් එළවගෙන ගියා.



අනේ යාළුවනේ මට සමාවෙන්න. මට අනින්න එපා. මට මී පැණි බොන්න ආස හිතුණා. ඒකයි මී වදය ළඟට ආවේ. වඳුරා කිවුවා.



අපි මේ පාර ඔයාට සමාව දෙනවා. ඒත් ආය කවදාවත් මී වදය ළඟට එන්න එපා. එක මී මැස්සෙක් කිවුවා. තව මී මැස්සෙක් කොප්පයකට මී පැණි ටිකක් දාලා වඳුරාට දුන්නා.වඳුරා රස කරමින් මී පැණි බිව්වා.



හරිම රසයි යාළුවනේ. බොහොම ස්තූතියි. මේ තරම් හොඳ ඔයාලට නපුරු දළ තියෙන්නේ ඇයි? වඳුරා ඇසුවා.



අපි ගොඩක් මහන්සි වෙලා මී පැණි එකතු කරන්නේ. ඒවා පැහැර ගන්න අයට දඬුවම් දෙන්න තමයි දළ තියෙන්නේ. මී මැස්සෝ කිවුවා.



ඉතින් ආය කවදාවත් වඳුරා මී මැස්සන්ගෙන් මී පැණි හොරකම් කරේ නෑ. මී මැස්සොයි වඳුරයි හොඳ යහළුවෝ වුණා.

නිමි.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)